# ආහාර මිල දී ගැනිමේ දී රසායනික ද්‍රව්‍යවල අවදානම පිළිබඳ සන්නිවේදනය පාරිභෝගිකයින්ට බලපාන ආකාරය (පස්සර ග්‍රා.නි.කො ආශ්‍රයෙන්)

ඩබ්. ඒ. එස්. විජේකෝන්*, .ජී. ඩබ්. පී. ප්‍රසාද්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
*wije6309@gmail.com

ආහාර නිෂ්පාදකයින් විසින් ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීමට, කල්තබා ගැනීමට, ආහාරයේ පෙනුම පවත්වා ගැනීමට වශයෙන් විවිධ රසායනික ද්‍රව්‍ය භාවිත කරයි. මෙම රසායනික ද්‍රව්‍ය භාවිතය මිනිසාගේ සෞඛ්‍යය පිරිහීම කෙරෙහි බලපාන ප්‍රධාන ම හේතු සාධකයක් බවට පත්ව තිබේ. මේ නිසා පාරිභෝගිකයින්ට ආහාර මිල දී ගැනීමේ දී ආහාරවල ඇති රසායනික ද්‍රව්‍ය පිළිබඳව අවධානය යොමු කිරීමට සිදු වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් ආහාර ද්‍රව්‍ය මිල දී ගැනිමේ දී රසායනික ද්‍රව්‍යවල අවධානම පිළිබඳ සන්නිවේදනය පාරිභෝගිකයන්ගේ චර්යාවන්ට බලපාන ආකාරය පිළබඳව අධ්‍යයනය කොට ඇත. මෙහි ප්‍රධාන අරමුණ ලෙස ආහාර ද්‍රව්‍ය මිල දී ගැනිමේ දී රසායනික ද්‍රව්‍යවල අවධානම පිළිබඳ සන්නිවේදනය පාරිභෝගිකයින්ට බලපාන අයුරු අධ්‍යයනය කිරීමත්, අතිරේක අරමුණු ලෙස ආහාර නිෂ්පාදනයේ දී රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නිෂ්පාදකයා ලෙස ද පාරිභෝගිකයා ලෙස දැනුවත් ද යන්න සෙවීම, ජනතාව විසින් රසායනික ද්‍රව්‍ය හා රසකාරක භාවිත කිරීමට පෙළඹෙන විවිධ හේතු හඳුනා ගැනීම, රසායනික ද්‍රව්‍ය හා රසකාරක හේතුවෙන් ඇති වන විවිධ රෝගාබාධ හඳුනාගැනීමත් හැඳින්විය හැකි ය. ආහාරවල ඇති රසායනික ද්‍රව්‍ය පිළිබඳ දැනුවත්භාවය ආහාර මිල දී ගැනීම කෙරෙහි ඇති කරන බලපෑම මෙහි පර්යේෂණ ගැටලුව වන අතර අධ්‍යයන ප්‍රදේශය වන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර ග්‍රාම නිළධාරී කොට්ඨාසය යි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස අහඹු ලෙස කුටුම්බ 100 කින් ප්‍රශ්නාවලි මඟින් හා සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු ලබාගෙන ඇත. දත්ත දායකයින්ගෙන් 77% ක් මිල දී ගන්නා අතර 19% ක් මිල දී ගැනීම සහ වගා කිරීම සිදු කරයි. ඉතිරි පුද්ගලයින් වගාකිරීමෙන් පමණක් ආහාර ලබාගනී. මොවුන්ගෙන් 96%ක් ආහාර සඳහා විවිධාකාරයෙන් රසායනික ද්‍රව්‍ය භාවිත කරන බව පිළබඳව දැනුවත් අතර 6%ක් දැනුවත් බවක් නොමැත. දැනුවත් පුද්ගලයින්ගෙන් 80%ක් රසායනික ද්‍රව්‍ය යෙදූ ආහාර පරිභෝජනයට නුසුදුසු බව දැනගෙනත් එම ආහාර ද්‍රව්‍ය පරිභෝජනයට ගන්නා අතර එයට හේතු වන්නේ රසායනික ද්‍රව්‍ය ඇති ආහාර වෙළඳපොළේ බහුලව පැවතීමත්, වගා නොකිරීමත්, අඩු මුදලට ලබාගත හැකිවීමත් ය. ඒ අනුව පැහැදිලි වනුයේ ජනතාව ආහාරවල පවතින රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනුවත්භාවයෙන් සිටිය ද ආහාර මිල දී ගැනීමේ දී එම කරුණට අමතරව වෙනත් කරුණු ප්‍රධාන ගැටලුව යටපත් කරමින් ඉදිරියට පැමිණ ඇති බවයි.

**ප්‍රමුඛ පදඃ** ආහාර; පරිභෝජනය; රසායනික ද්‍රව්‍ය; සන්නිවේදනය